## දේශීය යන්ත්‍රෝපකරණ නිෂ්පාදනයට කාර්මික සංවර්ධන මණ්ඩලය අත දෙයි

ලංකා කාර්මික සංවර්ධ මණ්ඩලය දේශීය යන්ත්‍රෝපකරණ නිෂ්පාදකයින් සඳහා ප්‍රදර්ශනාගාරයක් ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ පිහිටුවා ඇත. ගරු එස්.බී. නාවින්න ඇමතිතුමාගේ මඟපෙන්වීම මත ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති ජාලිය නාවින්න මහතාගේ උපදෙස් පරිදි ආරම්භ කළ මෙම ප්‍රදර්ශනාගාරය මගින් ව්‍යවසායකයන්ට සහ ස්වයං රැකියා ආරම්භ කරන්නන්ට අවශ්‍ය ව්‍යාපෘති හා කාර්මික තොරතුරුද ලබාදෙයි. නව ව්‍යවසායකයින්ට සහ ස්වයං රැකියාලාභීන්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ මෙහිදී හඳුනාගැනීමට සහ ඇනවුම්කර සපයාගැනීමට හැකිවේ. ඒ වගේම දේශීය යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය කරන කර්මාන්ත හිමියන්ට ඔවුන්ගේ යන්ත්‍රෝපකරණ අලෙවිය සඳහා ප්‍රදර්ශනය කිරීමට පහසුකම් සලසා ගැනීම සහ අලෙවි පහසුකම් ලබාගෙන වෙළඳපොළ සංවර්ධනය කරගැනීමටද සේවා සපයාදෙනු ලබයි. එමගින් දේශීය නිෂ්පාදකයින්ට අවශ්‍ය සේවා සපයමින් උදව් කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලය කටයුතු යොදා ඇත.

විවිධ නිෂ්පාදන ක්ෂේත්‍රයන්ට අවශ්‍ය දේශීය නිෂ්පාදිත යන්ත්‍රෝපකරණ මෙහි ප්‍රදර්ශනට තබා ඇත. ඒවා අතර පිටි අඹරන යන්ත්‍ර, එළවළු කපන ආහාර ක්ෂේත්‍රයේ යන්ත්‍ර, කෙඳි කොහු ආශ්‍රිත නිෂ්පාදනය සඳහා යන්ත්‍ර, පාවහන් නිෂ්පාදන යන්ත්‍රෝපකරණ ඇසුරුම් උපකරණ, කඩදාසි සහ ඉටිපන්දම් නිෂ්පාදන ස්වයං රැකියා සඳහා යන්ත්‍ර ප්‍රධාන වේ. රට තුළ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනයට කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියළුම දිස්ත්‍රික් හා පළාත් කාර්යාල මගින් කුඩා හා ග්‍රාමීය ව්‍යවසායකයින්ට උදව් කිරීමට අවශ්‍ය සේවා සැපයීමට සැලසුම්කර ඇති බව සභාපතිතුමා පවසයි.

## IDB SUPPORTS LOCAL ENTREPRENEURS

The Industrial Development Board (IDB) has established a Display Centre to promote locally manufactured machinery and equipment at the Ministry of Rural Industries and Self Employment Promotion at No. 780, Maradana Road, Colombo 10. It provides relevant project and machinery information to entrepreneurs and self employed persons.

This Centre was set up on a concept mooted by Hon. S.B. Navinna, Minister of Rural Industries and Self Employment Promotion, on the instructions of the Chairman IDB, Jaliya Navinna. Potential entrepreneurs, manufactures and self employers may identify and order the necessary machinery and equipment at the Centre. On the other hand IDB has facilitated the manufacturers to display their machinery and equipment in order to obtain orders. Locally manufactured equipment such as flour grinders, vegetable cutting machines, candle making machines, coir products, food products, paper products, light engineering products, footwear etc. are displayed at this Centre.

The IDB through it's District and Provincial Network is always at the service of Small and Medium Scale Entrepreneurs and extends a helping hand to develop rural industries in the country.

### උසස් තත්ත්වයේ යෝගට් නිෂ්පාදනය

**අන්තර්ගතය**

- යෝගට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය
- යෝගට් නිෂ්පාදන ක්‍රියාවලිය
- යෝගට් නිෂ්පාදනයේදී භාවිතාවන යන්ත්‍ර උපකරණ හා ඒවා ලබාගත හැකි ස්ථාන
- යෝගට් මුහුන් භාවිතයේ වැදගත්කම සහ මුහුන් පවත්වා ගැනීම
- යෝගට් සඳහා වෙළඳපොළ
- යහපත් නිෂ්පාදන පිළිවෙත්
- යෝගට් නිෂ්පාදනයට බලපාන නීතිරීති
- කර්මාන්තශාලා සැලසුම් සකස් කිරීමේදී සැලකිය යුතු කරුණු
- Important Food Regulations
- Standards Related to Hygiene

කා.ස.ම. තොරතුරු ගොනුවකි
මිළ රු. 500/-